**ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්**

(සමාගම් අංකය PB 5180)

ඇක්සස් ටවර් II (14 වන මහල), අංක 278/4, යූනියන් පෙදෙස, කොළඹ 02, ශ්‍රී ලංකාව.

දුරකථන: 011-2428428 විද්‍යුත් තැපෑල: info@fairfirst.lk වෙබ් අඩවිය: www.fairfirst.lk

# ෆෙයාෆස්ට් මොබිටෙල් රක්ෂණාවරණය

## 1. හැඳින්වීම

රෝගී තත්ත්වයක් හෝ හදිසි අනතුරක් නිසා ඇතිවන කායික දුබලතාවයකදී රක්ෂිතයාට තමන් එතෙක් ලැබූ ආදායම අහිමි වන අවස්ථාවකදී ඔහුට/ඇයට අත්වැලක් වීම සඳහා ආදායම් අහිමිවීම් රක්ෂණාවරණය හඳුන්වා දී ඇත. එමෙන්ම රැකියාව අහිමි වීම නිසා ආදායම් අහිමි වීම සහ හදිසි අනතුරක් නිසා සිදුවන මරණය යන අතිරේක ආවරණද මෙම රක්ෂණාවරණයට ඇතුළත් කර ඇත. මොබිටෙල් පෙරගෙවුම් හා පසුගෙවුම් සම්බන්ධතා භාවිතා කරන තනි පුද්ගල පාරිභෝගිකයන්ට මොබිටෙල් හරහා මෙම සේවාව ලබාගත හැකි අතර, පෙරගෙවුම් පාරිභෝගිකයන් සඳහා දෛනිකවත්, පසුගෙවුම් පාරිභෝගිකයන් සඳහා මාසිකවත් වාරික අයකර ගැනේ.

පහත සඳහන් ප්‍රතිලාභ ලයිස්තුවේ දක්වා ඇති ගාස්තු, මොබිටෙල් සමාගම විසින් සිය පෙරගෙවුම් හා පසුගෙවුම් පාරිභෝගිකයන්ගෙන් අයකරගෙන, ෆෙයාෆස්ට් සමාගම වෙත ලබාදෙනු ඇත.

වාරික නිසි පරිදි අඩුවී නොමැති අවස්ථාවකදී, පහත ප්‍රතිලාභ ලයිස්තුවේ සඳහන් ආකාරයට, රු.8,400/- ක වන්දි මුදල සහ වෙනත් ප්‍රතිලාභ අනුපාතික වශයෙන් ගෙවීම සිදුවේ.

සම්පූර්ණ ලිත් මාසයක වාරිකය ගෙවීමෙන් අනතුරුව, ඊළඟ මාසයේ සිට මෙම ආවරණය බලාත්මක වේ.

## 2. ප්‍රතිලාභ ලැයිස්තුව

| වාරික | | | ආදායම අහිමි වීම | | රැකියාව අහිමි වීම | | හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය |
|---|---|---|---|---|---|---|---|
| දෛනික ගාස්තුව (බදු රහිත) | දෛනික ගාස්තුව (බදු සහිත) | මාසික ගාස්තුව (බදු සහිත) | සතිපතා ප්‍රතිලාභය | වාර්ෂික ආවරණය | ආවරණය | වැටුප් ගණන | ප්‍රතිලාභ මුදල |
| 5.00 | 6.07 | 182.08 | 8,400.00 | 35,000.00 | මාසික වැටුප හෝ රු.50,000/- යන දෙකෙන් අවමය | මාස 3 | 150,000.00 |
| 4.43 | 5.38 | 161.32 | 7,000.00 | 30,000.00 | | | |
| 3.74 | 4.54 | 136.19 | 5,600.00 | 24,000.00 | මාසික වැටුප හෝ රු.50,000/- යන දෙකෙන් අවමය | මාස 2 | 100,000.00 |
| 3.06 | 3.71 | 111.43 | 4,200.00 | 18,000.00 | | | |
| 2.37 | 2.88 | 86.30 | 2,800.00 | 12,000.00 | මාසික වැටුප හෝ රු.50,000/- යන දෙකෙන් අවමය | මාස 1 | 50,000.00 |
| 1.69 | 2.05 | 61.54 | 1,400.00 | 6,000.00 | | | |
| | | 01-50 | 1,400.00 | 3,000.00 | අදාළ නැත | අදාළ නැත | අදාළ නැත |

සේවා ගාස්තුව ඇතුළු ඉහත සඳහන් වාරිකය 0.3% පරිපාලන බදු, 2.56% ජාතිය ගොඩනැගීමේ බදු සහ 18% වැට් බදු වලට යටත් වේ.

## 3. ආවරණය

### 3.1 ආදායම අහිමි වීම

රෝගයක් හෝ හදිසි අනතුරක් නිසා කායික අකර්මණ්‍යතාවක් සිදුවූ අවස්ථාවකදී සතිපතා ප්‍රතිලාභ ගෙවනු ලැබේ. මෙහිදී රක්ෂිතයා රෝහල් ගත වීමට අනිවාර්ය තත්ත්වයක පසුවිය යුතු ය. මෙම තත්ත්වය සනාථ කිරීම සඳහා සාක්ෂි ලෙස, 3.1.අ. කොටසේ දක්වා ඇති වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. මාසිකව අයකරනු ලබන මුදල, එනම් ප්‍රතිලාභ ලැයිස්තුවේ සඳහන් පරිදි අයවිය යුතු රු.182.08 මුදල පූර්ණ වශයෙන් ගෙවා නොමැති අවස්ථාවකදී, එම අනුපාතයට අනුව ප්‍රතිලාභ ගෙවීම සිදුවනු ඇත. රක්ෂිතයා අකර්මණ්‍යතාවට ලක්වී සිටි කාලය සතියකට අඩු නම් එම කාලයට අනුපාතිකව පමණක් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

3.1.අ. හිමිකම් මුදල් ඉල්ලීම සඳහා ඉදිරිපත් කළ යුතු වෛද්‍ය වාර්තා

හිමිකම් මුදල් ඉල්ලා සිටින අවස්ථාවකදී,

- රෝග විනිශ්චය කාඩ්පත
- හිමිකම් අයදුම් පත්‍රය සහ
- අනන්‍යතාව

ඉදිරිපත් කළ යුතු අතර අදාළ අකර්මණ්‍යතාව ඇතිවී දින 90 ක් ඇතුළත මේවා ඉදිරිපත් කළ යුතුය.

3.1.ආ. අඩුකරගැනීම්

රෝහල්ගත කාලසීමාවේ පළමු දිනය මෙම රක්ෂණ සැලසුම මගින් ආවරණය නොවේ.

රක්ෂණ සැලසුම ක්‍රියාත්මක වී ප්‍රථම මාස 3 ඇතුළත ඉදිරිපත් කරනු ලබන හිමිකම් මුදල් ඉල්ලීම් සඳහා 50% ක ප්‍රතිශතයක් අඩුකර ගැනේ. ප්‍රථම මාස 3 සම්පූර්ණ වී, එම මාස 3 සඳහා නිසිපරිදි වාරික මුදල් ගෙවීම් කර ඇත්නම්, ඉදිරි හිමිකම් සඳහා 100% ක හිමිකම් ලැබිය හැක.

3.1.ඇ. බැහැර කිරීම්

- සිහි විකල් වී හෝ නොවී සිටියදී සියදිවි නසාගැනීමට උත්සාහ කිරීම හෝ සිතාමතා තමන්ට හානි සිදුකර ගැනීම, මත්ද්‍රව්‍ය හෝ මත්පැන් භාවිතය හෝ අන්තරායකාරී ඖෂධ භාවිතය මගින් ඇතිවන අනතුරු හෝ රෝගා බාධ, දෙපා මගින් හැර වෙනත් ඕනෑම ආකාරයකින් සිදුකරනු ලබන ධාවනයන් මගින් සිදුවන අනතුරු, අන්තරායාකාර ක්‍රීඩාවන් යටතේ ස්කයිඩයිවින්, වෝටර් ස්කීන්ග් වැනි වෘත්තීය ක්‍රීඩා සහ නීති විරෝධී ක්‍රියාකාරකම් වල යෙදීම මගින් සිදුවන අනතුරු
- ගර්භනීභාවය, දරු උපත සහ ඒ සම්බන්ධ සැත්කම්, ගබ්සා වීම, ගබ්සා කිරීම් සහ ගර්භනීභාවය සම්බන්ධ සංකූලතා, දරු උපතට පෙර සහ පසු සත්කාර, දරුවන් පිළිසිඳගැනීම වැළැක්වීම සඳහා සිදු කරනු ලබන උපත් පාලන ශල්‍යකර්ම, කාර්මික හෝ රසායනික ක්‍රම, ලිංගික මඳසරුභාවය සම්බන්ධ ප්‍රතිකාර හා පරීක්‍ෂණ අකර්මන්‍යතාව වන්ධ්‍යකරණ ක්‍රම
- යුද්ධ හෝ ඕනෑම ආකාරයක යුධමය ක්‍රියා, සාපරාධී හෝ ත්‍රස්තවාදී ක්‍රියා, වැඩ වර්ජන, කැරලි කෝලාහල සහ විරෝධතා ආදියට සෘජුව සහභාගී වීම, මිනිස් ක්‍රියාකාරකම් හෝ පරමාණුක ඉන්ධන, පරමාණුක අපද්‍රව්‍ය හෝ න්‍යෂ්ටික අවි ආදිය මගින් විකිරණ වලට නිරාවරණය වීම මත සිදුවන අනතුරු ඕනෑම ආකාරයක ද්වේශ සහගත ක්‍රියාවක් ඇතුළුව මනුෂ්‍ය ක්‍රියාකාරකම් සහ ස්වාභාවික විපත් මගින් ඇතිවන තත්ත්වයන්
- මෙම සැලසුම මගින් ආවරණය වන රෝග වලට ප්‍රතිකාර කිරීමට රෝහල්ගත වීම් හැර වෙනත් අවස්ථාවලදී හුදෙක් සමාන්‍යයෙන් සිදුකරනු ලබන කායික, රසායනාගාර, විකිරණවේද හෝ උපකරණමය පරීක්ෂණ සඳහා රෝහල්ගත වීම, ශරීර පරීක්ෂාවන් වෛද්‍ය අධ්‍යයන, නිරීක්‍ෂණ සහ ඇන්ජියෝග්‍රෑම් පරීක්‍ෂණ හැර වෙනත් ආකාරයේ රෝග හඳුනා ගැනීමේ පරීක්ෂාවන් සඳහා වන රෝහල් ගත වීම්

### 3.2 රැකියාව අහිමි වීම

3.2.අ. ආවරණ පරාසය

රක්ෂිතයාගේ රැකියාව පහත කරුණුමත අහිමි වූ අවස්ථාවකදී එක් වරක් පමණක් මෙම ප්‍රතිලාභයට හිමිකම් කිව හැක.

- සමාගමක් සිය සේවක සංඛ්‍යාව අඩු කරන අවස්ථාවකදී
- සේවායෝජකයාට බලපාන නීති හා රෙගුලාසි අනුව (උදාහරණයක් ලෙස කිසියම් අංශයක් වසා දැමීමට සිදුවන අවස්ථාවකදී)
- සමාගම මූල්‍ය අර්බුදයකට මුහුණ දීම හෝ රෝගී තත්ත්වයක් නිසා රැකියාව අහිමි වීම
- ඕනෑම රාජ්‍ය අධිකාරියක ක්‍රියාවක් නිසා ව්‍යාපාරය වසා දැමීමට සිදුවීම

3.2.ආ. අවශ්‍ය ලිපිලේඛන

හිමිකම් මුදල් ඉල්ලා සිටින අවස්ථාවකදී රක්ෂිතයා විසින් පහත සඳහන් ලිපිලේඛන ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

- ස්ථිර සේවකයෙකු ලෙස රැකියාව කල බවට වූ ලිඛිත සාක්ෂි
- පසුගිය මාස 3 ක ස්ථාවර වැටුප සනාථ කරන, එම මාස 3 ට අදාළ වැටුප් පත්‍රිකා
- සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් ගෙවනු ලැබූ බවට සාක්ෂි

අදාළ සිදුවීමෙන් දින 90 ක් ඇතුළත අවශ්‍ය සියලු ලිපිලේඛන ඉදිරිපත් කළ පසු වැඩ කරන දින 7 ක් ඇතුළත අදාළ හිමිකම් මුදල එකවර ගෙවීමට රක්ෂණ සමාගම කටයුතු කරනු ඇත.

'රැකියාව අහිමි වීම' කාණ්ඩය යටතේ ප්‍රතිලාභ මුදල් ගෙවීමක් සිදුකළ පසු එම රක්ෂිතයාට නැවත 'හදිසි මරණ ප්‍රතිලාභ' කාණ්ඩය යටතේ හිමිකම් මුදල් ගෙවීමක් සිදු නොකෙරේ.

3.2.ඇ. බැහැර කිරීම්

- වංක ලෙස කටයුතු කිරීම, වංචාවන් සිදුකිරීම, රාජකාරියෙහි දුර්වලතා, සමාගමේ නීති හෝ වෙනත් නීතිරීති සිතාමතා කඩකිරීම, සමාගම විසින් සේවකයාට විරුද්ධව විනය පරීක්‍ෂණ පවත්වා සේවයෙන් නෙරපීම හෝ තාවකාලිකව සේවය අත්හිටුවීම සිදුකර ඇති අවස්ථාවකදී රක්ෂිතයාට ප්‍රතිලාභ මුදල් ගෙවීමට සමාගම බැඳී නොමැත.
- ස්වයං රැකියා වල නිරත වීම කොන්ත්‍රාත් පදනම යටතේ තාවකාලික නිශ්චිත කාලයකට පමණක් සිදුකරන රැකියාවල නිරත වී සිටීම ඇ) ඕනෑම ආකාරයට ස්වේච්ඡාවෙන් රැකියා විරහිත භාවයට පත්වීම රක්ෂණ සැලසුම ආරම්භ වන විට හෝ ආරම්භ වීමෙන් මාස 3 ක් ඇතුළත රැකියාව අහිමි වීම යන අවස්ථා වලදී රක්ෂිතයාට ප්‍රතිලාභ මුදල් ගෙවීමට සමාගම බැඳී නොමැත.
- ස්වේච්ඡාවෙන් හෝ එසේ නොමැතිව ඉල්ලා අස්වීම සහ විශ්‍රාම යාම යන අවස්ථා වලදී රක්ෂිතයාට ප්‍රතිලාභ මුදල් ගෙවීමට සමාගම බැඳී නොමැත.
- රක්ෂිතයා තාවකාලික පදනම මත සේවය කර, සේවය ස්ථිර කරනු නොලබන අවස්ථාවලදී ඇතිවන රැකියා අහිමිවීම් සඳහා රක්ෂිතයාට ප්‍රතිලාභ මුදල් ගෙවීමට සමාගම බැඳී නොමැත.
- සේවායෝජකයා හෝ රාජ්‍ය අධිකාරියක් මගින් සේවායෝජිතයාට එරෙහිව පරීක්‍ෂණයක් ආරම්භ කර එම හේතුව මත රැකියාව අත්හිටුවනු ලබන අවස්ථාවකදී රක්ෂිතයාට ප්‍රතිලාභ මුදල් ගෙවීමට සමාගම බැඳී නොමැත.

### 3.3 හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය

3.3.අ. ආවරණ පරාසය

හදිසි අනතුරක් නිසා රක්ෂිතයාගේ මරණය සිදුවන්නේ නම් සහ එම අනතුර සිදුවී දින 90 ක් ඇතුළත මරණය සිදුවී ඇත්නම්, ප්‍රතිලාභ ලැයිස්තුවේ සඳහන් ආකාරයට හදිසි අනතුරු මරණ ප්‍රතිලාභයට අදාළ ප්‍රතිලාභ මුදල ගෙවනු ඇත.

3.3.ආ. හිමිකම් මුදල් ඉල්ලීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපිලේඛන

- මරණ සහතිකය
- පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව
- පොලිස් වාර්තාව (අවශ්‍ය නම්)

අදාළ සිදුවීමෙන් දින 90 ක් ඇතුළත අවශ්‍ය සියලු ලිපිලේඛන ඉදිරිපත් කළ පසු වැඩ කරන දින 7 ක් ඇතුළත ප්‍රතිලාභ මුදල එකවර ගෙවීමට රක්ෂණ සමාගම කටයුතු කරනු ඇත.

'හදිසි මරණ ප්‍රතිලාභය' කාණ්ඩය යටතේ ප්‍රතිලාභ මුදල් ගෙවීමක් සිදුකළ පසු එම රක්ෂිතයාට නැවත 'රැකියාව අහිමි වීම' කාණ්ඩය යටතේ හිමිකම් මුදල් ගෙවීමක් සිදු නොකෙරේ.

3.3.ඇ. බැහැර කිරීම්

- අධික ලෙස මත්පැන් හෝ සිහිය විකල් කරවන මත්ද්‍රව්‍ය ආදිය භාවිතා කර සිටීම හෝ එසේ සිටියදී රිය පැදවීමේදී සිදුවන අනතුරු සහ රුධිරයේ මධ්‍යසාර මට්ටම අනුමත ප්‍රමාණයට වඩා ඉහළ මට්ටමක පවතින අවස්ථාවන්හිදී සිදුවන අනතුරු
- ත්‍රිවිධ හමුදා මෙහෙයුම් සහ ආයුධ භාවිතා කිරීමට අවශ්‍ය වන මෙහෙයුම් වල නිරත වීම සහ ත්‍රස්තවාදීන්, කැරලිකරුවන් ආදීන් මැඩලීම සඳහා හමුදා බලධාරීන්ගේ අණ පරිදි මෙහෙයුම් වලට සහභාගී වීම
- රක්ෂිතයා විසින් ලිඛිතව සමාගම වෙත දැනුම් දී අනුමැතිය ලබාගත් ක්‍රීඩා හැර දිය යට කිමිදීම, පැරෂුට්, හෑන්ඩ් ග්ලයිඩින්, කඳු හෝ ගල් මත නැගීම, පාද මගින් හැර වෙනත් ඕනෑම ආකාරකට කරනු ලබන ධාවන තරග, ඔරු පැදීම, බන්ජී ජම්පින්, ගුහා ගවේෂණය සහ වෙනත් ඕනෑම ක්‍රීඩාවක වෘත්තීය මට්ටමින් නිරත වීම
- හිම කඳු කඩාවැටීම්, නායයාම්, භූ කම්පන, ගංවතුර, ගිනිකඳු පිපිරීම්, භූ කම්පන මත ඇතිවන සුනාමි සහ උදම් රළ, සුළිසුළං, කුණාටු සහ අනෙකුත් සියලුම ආකාරයේ චණ්ඩමාරුත ඇතුළුව ඕනෑම ආකාරයක ස්වාභාවික විපත්
- හදිසි අනතුරක් ඇතිවන අවස්ථාවේදීම හෝ හදිසි අනතුරක ප්‍රතිඵලයක් ලෙස ඇතිවන විෂ ශරීරගත වීම හැර අනෙකුත් ඕනෑම ආකාරයට විෂ ශරීරගත වීම්
- රක්ෂණ සැලසුම් යෝජනාවේ හෝ සෞඛ්‍ය ප්‍රකාශයේ සඳහන් කර ඇති රැකියාවට වඩා සැලකිය යුතු ආකාරයකින් වෙනස් වන රැකියාවක යෙදී සිටියදී ඇතිවන මරණ සඳහා වන්දි ගෙවීමට රක්ෂණ සමාගම බැඳී නොමැත.

## 4. රක්ෂණ සැලසුමට අදාළ පොදු කොන්දේසි

### 4.1 භූගෝලීය සීමාව

මෙම රක්ෂණ සැලසුමට අදාළ සියලුම ප්‍රතිලාභ හිමිවනුයේ ශ්‍රී ලංකාව තුළදී සිදුකරනු ලබන වියදම් සඳහා පමණි.

### 4.2 සැලසුම ආරම්භ වීම සහ අලුත් කිරීම

ප්‍රතිලාභ ලැයිස්තුවේ සඳහන් ආකාරයට පළමු මාසය සඳහා දෛනික ගෙවීම් සිදුකිරීමෙන් අනතුරුව ඊළඟ ලිත් මාසයේ සිට රක්ෂණ සැලසුම බලාත්මක වේ. ඉන් අනතුරුව, සමාගම විසින් දැනුම් දෙනු ලබන ආකාරයට, ඒ වනවිට ක්‍රියාත්මක වන වාරික අනුපාත අනුව සැලසුම අලුත් කිරීමේ හැකියාව පවතී.

### 4.3 හිමිකම් මුදල් සීමාවන්

වාරික ගෙවන ලද ආකාරය අනුව 1 කොටසේ සඳහන් ආකාරයට, රෝහලෙහි ගතකරන ප්‍රථම රාත්‍රිය සඳහා හැර, රෝහල්ගත වී ප්‍රතිකාර ලබන සෙසු කාලසීමාව සඳහා දෛනික දීමනාවක් ගෙවනු ලැබේ. කැලැන්ඩර මාස 12 ක් සඳහා ගෙවනු ලබන උපරිම හිමිකම් මුදල් සීමාව, 1 කොටසේ දක්වා ඇති වාර්ෂික සීමාවට වැඩි නොවිය යුතුය.

### 4.4 වයස් සීමාව

වයස අවුරුදු 18 ත් 65 ත් අතර පුද්ගලයන්ට මෙම රක්ෂණ සැලසුම ලබාගත හැකි අතර වයස අවුරුදු 70 න් පසු ආවරණය අවසන් වේ.

### 4.5 රක්ෂණාවරණ අතිරික්තය

සැලසුම ක්‍රියාත්මක වූ දිනයේ සිට මාස 3 ක් ඇතුළත ඉදිරිපත් කරනු ලබන හිමිකම් මුදල් ඉල්ලීම් සඳහා 50% ක අතිරික්තයක් අදාළ වන අතර ඉන් අනතුරුව, හිමිකම් මුදල් ඉල්ලීමක් ඉදිරිපත් වන තුරු එය ඉවත් කළ හැක.

හිමිකම් මුදල් ඉල්ලීමක් ඉදිරිපත් වුයේ නම්, එවැනි ඉල්ලීමකින් අනතුරුව මාස 3 ක කාලයක් දක්වා යළි 50% අතිරික්තය අදාළ වේ. මාස 3 ක කාලය ගතවූ පසු රක්ෂිතයා නැවතත් 100% ප්‍රතිලාභ මට්ටමට හිමිකම් කියනු ඇත.

### 4.6 වාරික ගෙවීම

රක්ෂණ හිමියා ප්‍රතිලාභ ලැයිස්තුවේ සඳහන් වන ආකාරයට බදු සමග වාරික මුදල් ගෙවිය යුතුය. ග්‍රාහකයා මාසයක කාලයක් තුළ ගෙවීම සිදු නොකළහොත්, ගෙවීම සමාගම වෙත ලැබුණු පසුව දින 30 ක බලා සිටීමේ කාලයක් අදාළ වනු ඇත.

### 4.7 දැනුම්දීම්

සමාගම වෙත කරනු ලබන දැනුම්දීම් සියල්ල ලිඛිතව, සමාගමේ ලිපිනයට එවිය යුතු ය. ෆෙයාෆස්ට් ඉන්ෂුවරන්ස් සමාගම රක්ෂිතයා හා සම්බන්ධ වීම සඳහා ඔහුගේ හෝ ඇයගේ අදාළ මොබිටෙල් දුරකථන අංකය භාවිතා කරනු ඇත.

### 4.8 වෙනස් කිරීම්

සමාගමේ වාර්තා වල සඳහන්, රක්ෂිතයා අවසන් වරට දැනුම් දී ඇති ලිපිනයට දින 30 කට පෙර ලිඛිතව දැනුම්දීමක් කිරීමෙන් අනතුරුව, මෙම සැලසුමෙහි වගන්ති හා ප්‍රතිපාදන වෙනස් කිරීමේ අයිතිය සමාගම සතුය.

### 4.9 හිමිකම් මුදල් ඉල්ලීමක් ඉදිරිපත් කිරීම

රෝහල්ගත වීමක් සම්බන්ධ හිමිකම් මුදල් ලබාගැනීම සඳහා රෝහලෙන් පිටත් වී ගොස් දින 60 ක් ඇතුළත හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

**4.10 හිමිකම් මුදල් ගෙවීම**

හිමිකම් මුදල් ලබා ගැනීමට අදාළ සියලුම ලිපිලේඛන සමාගම වෙත ලැබුණු පසුව, වැඩකරන දින 5 ක් ඇතුළත අදාළ හිමිකම් මුදල් රක්ෂිතයාගේ නමට ගෙවීමට සමාගම කටයුතු කරනු ඇත.

**4.11 තොරතුරු සහ සාක්ෂි සහතික කිරීම**

සමාගමට අවශ්‍ය වන තොරතුරු සහ සාක්ෂි ආදිය සමාගමට අවශ්‍ය පරිදි, සහතික කිරීම සඳහා වූ වියදම් රක්ෂිතයා විසින් දැරිය යුතුය.

හිමිකම් මුදල් ඉල්ලීම වංචනික ක්‍රියාවක් බව හෝ පවතින තත්ත්වය වැඩිකොට දැක්වීමක් බව පෙනී යන්නේ නම් හෝ එබඳු ඉල්ලීමක් සනාථ කිරීමට ව්‍යාජ කරුණු දැක්වීමක් කර ඇති බව පෙනී යන්නේ නම් රක්ෂිතයාට හිමිකම් මුදල් ගෙවීමෙන් වැළකීමේ අයිතිය සමාගම සතුය.

**4.12 ව්‍යවස්ථාපිත නීතිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති ප්‍රකාරව මෙම රක්ෂණ සැලසුම නිකුත් කර ඇති අතර එම නීති මගින් එය පාලනය වේ.

**4.13 ගෙවීම් කළ යුතු මුදල් වර්ගය**

රක්ෂිතයා සඳහා සමාගමට කරනු ලබන සියලුම ගෙවීම් ශ්‍රී ලංකා රුපියල් වලින් සිදුකරනු ලැබේ.

**5. අර්ථ දැක්වීම්**

5.1 **හදිසි අනතුරක් යනු** නිශ්චිතව හඳුනාගත හැකි වේලාවක, වෙනත් බාහිර හේතුවකින් තොරව සිදුවන, ශාරීරික තුවාල ඇතිකරන හදිසි, සිතාමතා නොවන, අනපේක්ෂිත, අසාමාන්‍ය සහ විශේෂ සිදුවීමකි.

5.2 **වාර්ෂික සීමාව යනු** රක්ෂණ සැලසුම මුලින්ම ආරම්භ වීමෙන් පසු වසරක කාලයක් ඇතුළත රෝහල්ගත වීමකදී රක්ෂිතයාට ලබාගත හැකි උපරිම ප්‍රතිලාභ මුදල් සීමාවයි.

5.3 **රෝගයක් යනු** සාමාන්‍ය නිරෝගී ජීවන රටාවෙන් ව්‍යාධිවේදමය වශයෙන් වෙනස් වන කායික තත්ත්වයකි.

5.4 **රෝහලක් යනු** නිසි ලෙස ව්‍යවස්ථාපිත කළ, රෝගී හා අනතුරට පත්වූ පුද්ගලයන්ට ප්‍රතිකාර කළ හැකි රෝහලක් ලෙස සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ, රෝග හඳුනා ගැනීමට සහ ප්‍රධාන පෙළේ සැත්කම් සිදුකිරීමට අවශ්‍ය පහසුකම් පවතින, ලියාපදිංචි හා උපාධිධාරී හෙදියන් විසින් පැය 24 පුරා හෙද සේවා සපයන ස්ථානයක් වේ.

5.5 **රෝහල්ගත වීම යනු** මූලික වශයෙන් බාහිර රෝගියෙකු, එක්දින සැත්කමකට ලක්වූවෙකු හෝ හදිසි ප්‍රතිකාර ඒකකයකට ඇතුළත් කරනු ලැබූ පුද්ගලයෙකු ලෙස ප්‍රතිකාර ගැනීමෙන් අනතුරුව, විශේෂඥ වෛද්‍යවරයෙකු යටතේ, ලියාපදිංචි අභ්‍යන්තර රෝගියෙකු ලෙස රෝහලකට ඇතුළු වී එහි නතර වී ප්‍රතිකාර ලබාගැනීමට සිදුවීමයි.

5.6 **තුවාල යන්නෙන්** හදිසි අනතුරක් නිසා පමණක් සිදුවූ ශාරීරික හානි අදහස් වේ.

5.7 **අභ්‍යන්තර රෝගියෙකු යනු** රෝගයක් නිසා හෝ තුවාල නිසා රෝහලක ප්‍රතිකාර ගැනීම සඳහා ඇතුළත් කරන ලද, වෛද්‍යවරයෙකුගේ පූර්ණ කාලීන අවධානය හා නිරීක්ෂණය අවශ්‍ය වන, එක් රාත්‍රියකට වඩා රෝහලේ නැවතී ප්‍රතිකාර ලබාගැනීමට සිදුවන පුද්ගලයෙකි.

5.8 **රක්ෂිතයා යනු** ඊට පෙර මාසයේදී මොබිටෙල් වාරික ගෙවීමේ ක්‍රමයට දායක වූ ග්‍රාහකයෙකු වේ.

5.9 **සැත්කම් යන්නෙන්** පහත සඳහන් වෛද්‍ය ක්‍රියාවලීන්ගෙන් ඕනෑම ක්‍රියාවලියක් අදහස් වේ: දන්ත වෛද්‍ය සේවා හැර ශරීරයේ ඕනෑම ඉන්ද්‍රියක හෝ අවයවයක දෝෂ නිවැරදි කිරීම, වෙනස් කිරීම හෝ නැවත සැකසීම සඳහා කැපුමක්, ඉවත් කිරීමක් හෝ විද්‍යුත් ක්‍රියාවලියක් සිදුකිරීම.

**මෙම ලේඛනය ඉංග්‍රීසි මුල් පිටපතේ සිංහල අනුවාදයකි. අර්ථය සම්බන්ධයෙන් මතභේදයක් පැන නගින අවස්ථාවකදී ඉංග්‍රීසි මුල් පිටපතේ අර්ථය වලංගු වන බව කරුණාවෙන් සලකන්න.**